# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 89 — 1973 දෙසැම්බර් 07 වැනි සිකුරාද — 1973.12.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... | අතිරේක | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දැන්වීම ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම ... ... ... | 216 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | බුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 207 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම ... ... | 215 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... ... | — | විවිධ දැන්වීම ... ... ... | — |


සැලකිය යුතුයි.—පොලිස් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 නොවැම්බර් 30 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම්

### අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් උසාවිය

### පරණ නඩුපොත් විනාශ කිරීම

පහත උපලේඛනයේ සඳහන් කර ඇති අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් උසාවියේ නඩු පොත් අද දින සිට මාස තුනකින් පසු ප්‍රඥප්ති නීති සංග්‍රහයේ (1956) ප්‍රතිශෝධිත සංස්කරණයේ 479 වැනි පරිච්ඡේදයේ විධිවිධානයන්ට යටත්ව විනාශ කරන බැව් මෙයින් දැනුම් දෙමි.

යම් නඩු පොතක් විනාශ නොකල යුතු බවට උනන්දුවක් දක්වන කෙනෙක් වෙතොත් ඔහු විසින් පුද්ගලිකව හෝ නීතිඥ මහතෙකු මගින් හෝ පෙත්සමක් මගින් හෝ ඊට කරුණු ඉදිරිපත් කල යුතුය.

ජී. ජී. ඩී. ද සිල්වා,
අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත්.

1973 නොවැම්බර් මස 26 වෙනි දින,
අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවියේදී ය.

උපලේඛනය

නඩු අංක : 1 සිට 12,999 දක්වා

වර්ෂය : 1951 සිට 1954 දක්වා.

12–184—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළු දෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1972 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

උපලේඛනය

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුල් කෝරලේ උඩපත්තුවේ ඉලුඹෙකන්දේ පිහිටි දැනට බෙදු වෙන්කර ඇති එකට යාව පිහිටි '' මෝර්නිං සයිඩ්'' සහ ''ශාන්ත රෝනන්ස්'' වත්ත නැමති ඇම්. ඩබ්ලිව්. රත්නායක, අවසරලත් මානක තැන විසින් මැන සාද ඇති අංක 1307 හා 72.9.22 දරණ අවසන් ප්ලෑනේ ලොට් 1 සිට 4 දක්වා වූ ඉඩම් කැබලි වලින් සමන්විත '' බී '' අක්ෂරය දරණ ඉඩම් කොටසට යථෝක්ත ප්ලෑන අනුව මායිම්, උතුරට : රජයේ ඉඩම් ද, නැගෙන හිරට : රජයේඉ ඩම් ද, දකුණට : ගම්සභා පාර ද, බස්නාහිගරට : ඉහත සඳහන් ප්ලෑනේ '' ඒ '' අක්ෂරය දරණ '' බ්ලොක් '' එකින් ද මායිම් වූ අක්කර 69 රූඩ් 2 පර්චස් 15 ක් විශාල වූ ඉඩම සහ එහි තුළ ඇති '' බී '' '' සී '' හා '' ඩී '' අක්ෂරය දරණ ගොඩනැගිලි සහ එහි තුළ ඇති සියලු දේත් වේ.

කේ. පී. කරුණාදස,
සබරගමුවේ පිස්කල් වෙනුවට.

12–231—73.12.07 දින අංක 89 දරන හැසට් පත්‍රය

---

# බූදල් නඩු පිළිබඳ දැන්වීම්

**ගාල්ලේ දිසා අධිකරණයේ දීය.**
නයිසයි නියෝගයයි.

ගාල්ලේ මඩපාතල සිට නැසීගිය වැලිහිඳ බඩල්ගේ දනෝරිස් සිල්වාගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති බූදලයේ කරුණ පිළිබඳවයි.

ගාල්ලේ මඩපාතල අංක 30හේ පදිංචි වැලිහිඳ බඩල්ගේ කරුණාසේන.

............................................................................ පෙත්සම්කරු

**එදිරිව**

අංකය : ටී. 9386

ගාල්ලේ මඩපාතල අංක 30 හේ පදිංචි පහත සඳහන් අය
(1) රතුවඩුගේ සෙලෝනෝනා,
(2) පවුලස් ධර්මසේන වැලිහිඳ,
(3) සමරසේන වැලිහිඳ,
(4) පද්මා වැලිහිඳ නොහොත් සුරේන්ද්‍ර,
(5) ප්‍රේමා වැලිහිඳ,
(6) චිත්‍රා වැලිහිඳ නොහොත් අමේන්ද්‍ර,
(7) ආරියසේන වැලිහිද, .................. වගඋත්තරකරුවෝ

පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ඩී. පී. විජේනාරායන මහතා පෙනී සිටියදී මෙම කාරණය තීරණය කිරීම පිණිස වර්ෂ 1973ක් වූ ජූලි මස 13 වෙනි දින ගාල්ලේ දිසා විනිසුරු තැන්පත් එල්. එච්. ද අල්විස් මැතිතුමා ඉදිරිපිටදී පෙත්සම්කරුගේ වර්ෂ 1973ක් වූ ජූලි මස 10 වෙනි දින දරණ දිවුරුම් පත, පෙත්සම සහ ඒ සමග වූ මෝසමද කියවා බලා ඉහත නම් සඳහන් වගඋත්තර කරුවන් විසින් හෝ මේ ගැන සැලකිලිමත් වන වෙන් යම් අයෙක් හෝ අයවලුන් විසින් වර්ෂ 1973ක් වූ ඔක්තෝබර් මස 12 වෙනි දින පෙරවරු 10 ට හෝ ඊට පෙර මෙම උසාවියට ඒත්තුයනාකාර සෑහෙන විරුද්ධ තාවයක් දක්වා නොසිටිය හොත් ඉහත නම් සඳහන් පෙත්සම කරු මියගිය අයගේ වැඩිමහල් පුත්‍රයා වශයෙන් මෙම බූදලය පිළිබඳ පාලනය බලපත්‍රය නිකුත් කරවා ගනු ලැබීමට අයිතිය ලැබිය යුතු බව සහ මෙයින් ලැබෙන බැව් නියෝග කරනු ලැබේ.

ඇල්. එච්. ද අල්විස්,
දිසා විනිසුරු.

වර්ෂ 1973ක්වූ ජූලි මස 13 වෙනි දින දීය.

මෙම නයිසයි නියෝගය වර්ෂ 1974ක්වූ ජනවාරි මස 25 වෙනි දින තෙක් දීර්ඝ කරන ලදී.

ඇල්. එච්. ද අල්විස්,
12.10.73. දිසා විනිසුරු.

12–46—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

**ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේ දීය**
නයිසයි ආඥවයි

ගාල්ලේ තලාපිටිය පාරේ අංක 141 දරණ ස්ථානයෙහි විසූ නැසීගිය අගොස්තිනුගේ ආයුපාලගේ උරුමය නොපැවරූ බූදලය පිළිබඳ කරුන ගැනයි.

ගාල්ලේ තලාපිටිය පාරේ අංක 141 දරණ ස්ථානයේ පදිංචි ගීගනගේ ඥනවති

පෙත්සම්කාරිය

**එදිරිව**

අංක ටී. 9392

1. ගාල්ලේ තලාපිටිය පාරේ අංක 141 දරණ ස්ථානයේ පදිංචි අගොස්තිනුගේ වයලට්,
2. එම ස්ථානයෙහි පදිංචි අගොස්තිනුගේ ගාමිණිදාස,
3. එම ස්ථානයේ පදිංචි අගොස්තිනුගේ සුමනරත්න,
4. එම ස්ථානයෙහි පදිංචි අගොස්තිනුගේ දයාවති,
5. එම ස්ථානයෙහි පදිංචි අගොස්තිනුගේ රමනී,
6. එම ස්ථානයෙහි පදිංචි අගොස්තිනුගේ චම්පා ජයන්ති,
7. එම ස්ථානයෙහි පදිංචි අගොස්තිනුගේ හන්සා නිෂාන්ති,
8. එම ස්ථානයෙහි පදිංචි අගොස්තිනුගේ ජීවානි ශ්‍රීමාන්ති,
9. එම ස්ථානයෙහි පදිංචි අගොස්තිනුගේ රන්ගා දිනූෂ,
10. වලහන්දූවේ පින්නදූවේ පදිංචි ගීගනගේ විල්බට්,

.........................................වගඋත්තරකරුවෝ

වර්ෂ 1973 ක් වූ සැප්තැම්බර් මස 27 වෙනි දින ගාල්ලේ දිසා විනිසුරු ඇල්. එච්. ද අල්විස් මහතා ඉදිරියෙහි ඉහත නම් සඳහන් පෙත්සම්කාරිය වෙනුවෙන් නීතිඥ ඇම් සේමගේ මහතා පෙනී සිටියදී මෙම කරුණ විනිශ්චයට භාජනව පෙත්සම්කාරියගේ වර්ෂ 1973ක් වූ සැප්තැම්බර් මස 25 වෙනි දින දරණ දිවුරුම් පත කියවන ලදින් :

ඉහත නම් සඳහන් 10 වෙනි වගඋත්තරකරු ඉහත සඳහන් 1 සිට 9 දක්වා වූ බාලවයස්කාර වගඋත්තරකරුවන් නියෝජනය කිරීම පිණිස මෙම පටිපාටි කරය සඳහා ඔවුන්ගේ බාරකරු වශයෙන් මෙයින් පත් කරනු ලැබූ බව නියෝග කරනු ලැබේ.

තවද ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් හෝ මෙහි සම්බන්ධතාව යක් ඇති වෙනයම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් විසින් වර්ෂ 1973ක් වූ දෙසැම්බර් මස 21 වෙනි දින හෝ ඊට පෙර මෙම අධිකරණයට පිලිගතහැකි ප්‍රමාණවත් විරෝධතාවයක් නොදක්වුවහොත් ඉහත නම් සඳහන් නැසීගිය තැනැත්තාගේ වැන්දඹුව වශයෙන් ඉහත නම් සඳහන් පෙත්සම්කාරියට එකී නැසීගිය තැනැත්තාගේ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලය හිමිවිය යුතු බව සහ මෙයින් හිමිකර ප්‍රකාශ කෙරෙන බව වැඩිදුරටත් නියෝග කරනු ලැබේ.

තවද එකී 10 වෙනි විත්තිකරු ඉහත නම් සඳහන් 1 සිට 9 දක්වා වූ බාල වයස්කාර වගඋත්තරකරුවන් වර්ෂ 1973ක් වූ දෙසැම්බර් මස 21 වෙනි දින පෙරවරු 9 ට මෙම අධිකරණයට ඉදිරිපත් කල යුතු බවද වැඩිදුරටත් මෙයින් නියෝග කරනු ලැබේ.

ඇල්. එච්. ද අල්විස්,
දිසා විනිසුරු.

වර්ෂ 1973ක්වූ සැප්තැම්බර් මස 27 වෙනි දින දීය.

12–43—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

**ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේ දීය.**
**නයිසයි** ආඥව

පරගොඩ සිට නැසීගිය කෝඹල හේවාවිතානගේ ජේම්ස් අප්පුහාමිගේ අන්තිම කැමති පත්‍රයත් නොමැති බූදලය පිළිබඳ කාරණාවේ දීය.

පරගොඩ පදිංචි පරගොඩ ලියනගේ කරුණාවතී ...........................................
........ .........................................................................පෙත්සම්කාරිය.

බූදල් නඩු අංකය : 9383 **එදිරිව**

1. පරගොඩ පදිංචිකාරයෝ වන, කෝඹල හේවාවිතානගේ චන්ද්‍රිකා,
2. කෝඹල හේවාවිතානගේ ධර්මසේන,
3. කෝඹල හේවාවිතානගේ මල්ලිකා,
4. කෝඹල හේවාවිතානගේ යමුනාකාන්ති,
5. කෝඹල හේවාවිතානගේ අසෝකා,
6. කෝඹල හේවාවිතානගේ සිරෝමණි සුජාතා,
7. කෝඹල හේවාවිතානගේ රේණුකා,
8. කෝඹල හේවාවිතානගේ ප්‍රියන්ත,
9. කෝඹල හේවාවිතානගේ ලලිත් හේමන්ත,
10. කඩහෙට්ටිගේ ජේම්ස් අප්පුහාමි,..............................................

.... ..........................................................වගඋත්තරකාරයෝ.

මෙම කාරණය වර්ෂ 1973ක් වූ ජූලි මස 6 වෙනි දින ගාල්ලේ දිස්ත්‍රික් විනිශ්චයකාර එල්. එච්. ද අල්විස් මහතා ඉදිරිපිටදී පෙත්සම්කාරිය වෙනුවෙන් නීතිඥ ඇල්. ඇම්. සිරිසේන මහතා පෙනී සිටියදී සුදුස්සක් කිරීම පිණිස ගෙන පෙත්සම්කාරියගේ 1973 ජූනි මස 22 වෙනි දින දරණ දිවුරුම් සහතිකය සහ පෙත්සමද, කියවා බලා :

ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් හෝ මේ ගැන සැලකිලිමත් වන අයකු හෝ අයවලුන් විසින් 1973ක්වූ ඔක්තෝම්බර් මස 12 වෙනි දින හෝ එදිනට පෙර මෙම උසාවියට ඒත්තු යනාකාර සෑහෙන විරුද්ධවාදිකම් දක්වා නොසිටියහොත් ඉහත කී පෙත්සම්කාරිය ඉහත සඳහන් නැසීගිය අයගේ වැන්දඹුව හෙයින් එම නැසීගිය අයගේ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාත් බල කඩදසිය පෙත්සම්කාරිය වෙත නිකුත් කරන්නට යෙදෙනවා ඇත.

ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් හෝ මේ ගැන සැලකිලිමත් වන වෙනත් අය හෝ අයවලුන් විසින් 1973 ඔක්තෝබර් 12 වෙනි දින හෝ එදිනට පෙර මේ උසාවියට ඒත්තු යනාකාර සෑහෙන විරුද්ධවාදිකම් දක්වා නොසිටියහොත් ඉහත කී 10 වෙනි වගඋත්තරකාරයා මෙම නඩුව සම්බන්ධව සෑම කාරණයක් වෙනුවෙන් 1 සිට 9 දක්වා ඇති වගඋත්තකර කාරයන් නියෝජනය කිරීම සඳහා ඔවුන්ගේ භාරකාරකමට එකී 10 වෙනි වගඋත්තරකාරයා පත් කරන බව වැඩිදුරටත් නියම කරමි.

වර්ෂ 1973ක් වූ ජූලි මස 6 වෙනි දින දීය. එල්. එච්. ද අල්විස්,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

හේතු දැක්වීමේ දිනය 1974.01.29 දිනය දක්වා දීර්ඝ කරන ලදී.

එල්. එච්. ද අල්විස්,
දිසා විනිසුරු, ගාල්ල.

12–121—73.12.07 දින අංක 89 දරන ගැසට පත්‍රය

කෑගල්ල දිස්ත්‍රික් උසාවියේ දීය

නයිසයි තීන්දු ප්‍රකාශය

නිල්වක්කේ පදිංචිව සිට අන්තිම කැමති පත්‍රයක් තබා නැසීගිය මුහන්දිරම් රාල්ලාගේ කිරිබංඩාගේ බුදලය කාරණාව ගැනයි............නැසීගිය අය නිල්වක්කේ පදිංචි දෙලගේ රාල්ලාගේ ටිකිරිමැණිකේ නොහොත් උක්කු අම්මා........................................................පෙත්සම්කාරිය

අංකය : 2256/බුදල්

එදිරිව

1. නිල්වක්කේ පදිංචි මුහන්දිරම්රාල්ලාගේ ජිනදාස රත්නායක,
2. එම ගම පදිංචි එමගේ රත්නායක,
3. එම ගම පදිංචි එමගේ කුලරත්න,
4. එමගම පදිංචි එමගේ ගුණරත්න,
5. මීපිටියේ පදිංචි මුහන්දිරම්රාල්ලාගේ චිත්‍රා ජානකී පුෂ්පා කුමාරි,
6. එම ගම පදිංචි එමගේ හේමානන්දනී කුමාරි,
7. එම ගම පදිංචි එමගේ කමරාකුමාරි ප්‍රභාකුමාරි, (5 සිට 7 දක්වා බාල වයස්කාර වගඋත්තරකරුවන් වෙනුවෙන් 8 වෙනි වගඋත්තර කරු භාරකාරයා ලෙස පත් කරන ලදී).
8. එම ගම පදිංචි අදිකාරි අතුකොරාල්ලාගේ ප්‍රේමලතා විජේසුන්දර. ........................................................වගඋත්තරකරුවෝ.

මෙම කාරණය වර්ෂ 1973ක්වූ ජනවාරි මස 26 වෙනි දින කෑගල්ල දිස්ත්‍රික් විනිශ්චයකාර තැන්පත් සිරිමෙවන් අමරසිංහ මැතිතුමා ඉදිරියේ ඉහත නම් සඳහන් අයදුම්කාරිය වෙනුවෙන් නීතිඥ ඒ. ටී. ආර්. ගුණරත්න මහතා පෙනී සිටියදී විභාගයට ගෙන පෙත්සම්කාරියගේ වර්ෂ 1972කේ 29 වෙනි දින දරණ දිවුරුම් පත සහ 1973ක්වූ ජනවාරි මස 17 වෙනි දින දරණ පෙත්සමද කියවා බලා:

ඉහත නම් සඳහන් මුහන්දිරම්රාල්ලාගේ කිරිබංඩාගේ බුදලය පිළිබඳව ප්‍රෝබේට් බලපත්‍රය පෙත්සම්කාරියට නිකුත් කිරීමට සහ 5 සිට 7 වෙනි වගඋත්තරකාර බාල වයස්කරුවන්ගේ භාරකාරයා වශයෙන් 8 වෙනි වගඋත්තරකාරිය පත් කරන්නට යම් විරුද්ධතාවයක් තිබේ නම් එය වර්ෂ 1973ක්වූ මැයි මස 23 වෙනි දින වගඋත්තරකරුවන් හෝ මෙම දේපල පිළිබඳව සැලකිලි දක්වන වෙනත් අයවලුන් විරුද්ධවාදිකම් දක්වා නොසිටි යොහොත් නැසීගිය අයගේ අන්තිම කැමති පත්‍රය සහ තෙස්තමේන්තු පිළිබඳව ප්‍රෝබේට් බල පත්‍රය අයදුම්කරු වෙත නිකුත් කරන ලෙසත් සහ 5 සිට 7 දක්වා බාලවයස්කාර වගඋත්තරකරුවන් වෙනුවෙන් මෙම නඩුවේ කටයුතු කිරීමට සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම සඳහා 8 වෙනි වගඋත්තර කාරිය භාරකාරිය හැටියට පත් කරන ලෙසත් නියෝග කරණු ලැබේ.

ඩී ඊ. ධර්මසේකර,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

වර්ෂ 1973 ක්වූ ජනවාරි මස 26 වෙනි දින දීය.

හේතු දැක්වීමේ කාලය 73.10.3 වෙනි දින දක්වා දීර්ඝ කරන ලදී.

ඩී. ඊ. ධර්මසේකර,
1973.8.8. දිස්ත්‍රික් විනිශ්චයකාරතුමා,

හේතු දැක්වීමේ කාලය 1973.12.12 වෙනි දින දක්වා දීර්ඝ කරන ලදී.

ඩී. ඊ. ධර්මසේකර,
1973.10.3. දිස්ත්‍රික් විනිශ්චයකාර තුමා.

12–202—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති කැනට තැපැලෙන් එවීමට හෝ තෙනැවිත් භාර දීමට හෝ පුළුවනි.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට සවස 8.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගෙවීමේ කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශන එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝෂ වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. ඉඩාවියේ අග සහන් යටතේ නිකුත් කළායුතු නැගෙන ප්‍රකාශන, ප්‍රාදේශීය ඉඩාවියේ කොමසාරිස්තුමාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කොළඹවරයි මෙනම් පළවන දැන්වීම් සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති කැනට ලැබෙන්නට එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. | මෙරට ශ. | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ කිසිම දිනක ගෙවිය යුතු දායක ගාස්තු භාර ගනුලැබේ 6 මාසයකට හෝ අඩු කාලයකට පමණය.

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | මිල රු. | මිල ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|---|
| (අ) | (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් | 0 | 50 | 0 | 20 |
| | (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | 1 | 0 | 0 | 20 |
| (ආ) | (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | 0 | 30 | 0 | 15 |
| | (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන්** සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇත්වන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් **කොළඹ** මහලේකම් කාර්යාල **ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 73.12.07 සිකුරාද | ... | 73.11.30 සිකුරාද | දවල් 12.00 |
| | | 73.12.14 සිකුරාද | ... | 73.12.07 සිකුරාද | දවල් 12.00 |
| | | 73.12.21 සිකුරාද | ... | 73.12.14 සිකුරාද | දවල් 12.00 |
| | | 73.12.28 සිකුරාද | ... | 73.12.21 සිකුරාද | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.